## ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රීලංමබැ) - 2014

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරිය) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කිරීමේදී ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලවීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය සඳහා නිව්යෝර්ක් ගොඩනැගිල්ලට අදාළව කුලී ආදායම රු.3,479,296 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය .

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් නීති පනතේ (MLA) 39 වගන්තිය | විසර්ජනයෙන් පසු හා ශ්‍රී ලංකා රජයෙන් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුව උපයන ලද ලාභය මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මහා භාණ්ඩාගාරයට මාරු කළ යුතුය. ඒ අනුව, රු බිලියන 32.31 ක පාඩුවක් තිබුණද, සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තු දෙකේ ලාභයෙන් අත්තිකාරම් ගෙවීම් ලෙස 2014 වර්ෂයේ අවස්ථා 2 කදී රු.බිලියන 8.5 ක මුදලක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි. තවද රු. බිලියන 32.27 ක ශුද්ධ විදේශ විනිමය හුවමාරු ප්‍රත්‍යාගණන පාඩුව හා විදේශ වත්කම් මත රු.බිලියන 7.97 ක " Marked to Market " ලාභය/ පාඩුව ගණන් ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බෙදාහැරිය හැකි ලාභය ගණනය කර තිබුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගත් ඉපැයීම් ශේෂය රු. බිලියන 5.7 ක සෘණ වටිනාකමක්ව පැවතුණි.<br><br>" මුදල් නීති පනතේ 39 වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ගැලපීම් කිරීමෙන් පසු මුදල් වර්ෂය ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ ලාභයේ කොටසක් රජයට මාරු කිරීම සඳහා 2009 සැප්තැම්බර් මාසයේදී නීතිපතිවරයාගේ එකඟත්වය ඉල්ලා ඇති බව " මේ |

| | | |
|---|---|---|
| | | සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි. |
| (ආ) | 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් එකතුව රු.මිලියන 179.2 ක් හා රු.මිලියන 178.1 ක් උපයන විට ගෙවීම් බදු හා බදු මත බදු ලෙස සේවකයන්ගෙන් අයකර ගැනීමෙන් තොරව ස්වකීය අරමුදල් වලින් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු වලට පෙර රු.මිලියන 31,532 ක ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ පාඩුව රු.මිලියන 22,248 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 9,284 ක තවදුරටත් පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී විදේශ මූල්‍ය වත්කම් වලින් ශුද්ධ ආදායම රු.මිලියන 22,879 කින් වැඩිවීමට ප්‍රතිරූපීව විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව හා දේශීය මූල්‍ය වත්කම්වලින් ශුද්ධ වියදම් පිළිවෙලින් රු.මිලියන 5,508 කින් හා රු. මිලියන 24,601 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයේ රු.බිලියන 12.8 ක ශුද්ධ මෙහෙයුම් පාඩුවට (රු.බිලියන 26.8 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව ඇතුළත්ව) සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා රු. බිලියන 32.3 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව ඇතුළත්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු ශුද්ධ මෙහෙයුම් පාඩුව රු. බිලියන 20.2 ක් වූයෙන් මුළු ශුද්ධ මෙහෙයුම් පාඩුවේ සියයට 58 ක වැඩිවීමක් දැක්වුණි. මේ අතර ඉකුත් වර්ෂයේ ක්ෂය හා ක්‍රමක්ෂය ඇතුළත් රු. බිලියන 9.4 ක මෙහෙයුම් වියදම් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ එය රු. බිලියන 11.3 ක් වූයෙන් මෙහෙයුම් වියදම් සියයට 20 කින් වැඩිවීමක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආදායම හා වියදම වෙනස්වීම ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | 2014 | 2013 | වෙනස | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශතය |
| විදේශ මූල්‍ය වත්කම්වලින් ආදායම | 26.9 | 4.0 | 22.9 | 572.5 |
| විදේශ මූල්‍ය වගකීම් මත වියදම | 3.1 | 4.4 | (1.3) | (29) |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය/(පාඩුව) | (32.3) | (26.7) | (5.6) | 21 |
| දේශීය මූල්‍ය වත්කම්වලින් ආදායම/(වියදම) | (13.1) | 11.5 | (24.6) | (213.9) |
| මෙහෙයුම් වියදම | 11.3 | 9.4 | 1.9 | 20 |
| වර්ෂය සඳහා ශුද්ධ පාඩුව | (31.5) | (22.2) | (9.3) | (41.9) |

### 3.3 දේශීය මුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර ලෝහ මිල ඉහළ මට්ටමකට වැඩිවන තෙක් කාසි ප්‍රතිචක්‍රීකරණය නොකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණයක් ගෙන තිබුණි. මුහුණත වටිනාකම රු. 5 ක් හා රු. 2 ක් ලෙස සඳහන් වන පිළිවෙලින් මිලියන 3.25 ක් හා මිලියන 2.39 ක් වූ මුළු කාසි ප්‍රමාණය වර්ෂ ගණනාවක සිට 2014 දෙසැම්බර් 31 දක්වාම නොවිකුණා පැවතුණි.

(ආ) ඇතැම් සමරු කාසි තොග සංචලනය ඉතා සෙමින් සිදුවන බව නිරීක්ෂණය වූ අතර ඉන් පෙනී යන්නේ ඒ සඳහා මහජන ඉල්ලුම ඉතා පහළ මට්ටමක පවතින බවයි. 2014 දෙසැම්බර් 31 දිනට සුරක්ෂිතාගාරයේ පැවති එවැනි සමරු කාසිවල තොග තත්ත්වය පහත දැක්වේ.

| විස්තරය | නිකුත් කළ වර්ෂය | මුහුණත අගය | අච්චු ගැසූ කාසි ප්‍රමාණය | **2014 දෙසැම්බර් 31** දිනට සුරක්ෂිතාගාරයේ පැවති කාසි ප්‍රමාණය |
|---|---|---|---|---|
| | | රු. | | |
| 2500 බුද්ධ ජයන්තිය | 1957 | 5 | 500,000 | 20,263 |
| ආර්.ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තියේ 3 වන සංවත්සරය (රිදී) | 1992 | 1 | 2,000 | 204 |
| ආර්.ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තියේ 3 වන සංවත්සරය (රන්) | 1992 | 1 | 100 | 53 |
| 2300 අනුබුදු මිහිඳු ජයන්තිය | 1993 | 500 | 30,000 | 5,696 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 50 වන සංවත්සරය | 1995 | 5 | 5,000 | 3,948 |
| ශ්‍රී ලංකාවේ 50 වන නිදහස් සංවත්සරය | 1998 | 1,000 | 25,000 | 6,542 |
| ලෝක ක්‍රිකට් කුසලානය - 1996 | 1999 | 1,000 | 25,000 | 10,031 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ 50 වන සංවත්සරය | 2000 | 1,000 | 10,000 | 1,942 |
| ශ්‍රී ලංකා නාවික හමුදාවේ 50 වන සංවත්සරය | 2000 | 1 | 2,000 | 107 |
| 2550 බුද්ධ ජයන්තිය | 2006 | 2,000 | 10,000 | 8,193 |
| 2550 බුද්ධ ජයන්තිය | 2006 | 1,500 | 20,000 | 18,515 |
| ලෝක ක්‍රිකට් කුසලානය | 2007 | 1,000 | 10,000 | 7,839 |
| සේවක අර්ථසාධක අරමුදලේ 50 වන සංවත්සරය | 2008 | 1,000 | 100 | 20 |

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාවේ 60 වන සංවත්සරය (රිදී) | 2009 | 1,000 | 10,000 | 835 |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ 60 වන සංවත්සරය | 2010 | 5,000 | 5,000 | 3,221 |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**
**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි අනාගත මෙහෙයුම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 122.81 ක් වැය කරමින් බ්‍රසීලයේ දේපලක් මිලදී ගෙන තිබුණි. මෙම දේපල මිලදී ගැනීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර මෙම දේපල උපයෝජනය පිළිබඳ අනාගත සැලැස්මද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා තීරණය කර නොතිබුණි. කෙසේ වුවද මෙම දේපල 2015 පෙබරවාරි 01 දින සිට වර්ෂ 2 ක කාලයක් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයට කුලියට ලබා දී තිබූ අතර එදින සිට බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මෙම පරිශ්‍රයේ ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) 2011 අගෝස්තු 24 දින එජඩො 6,207,116 ක් (රු.607,121,953 ක්) වැය කරමින් නිව්යෝර්ක්හි ගොඩනැගිල්ලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්පත් කර ගෙන තිබූ අතර, එය අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව 2012 ජූනි 01 දින සිට වර්ෂ 3 ක කාලයක් සඳහා එජඩො 68,000 ක මාසික කුලියකට විදේශ කටයුතු අමාත්‍යාංශයට කුලියට දී තිබුණි. කෙසේ වුවද මුදල් නීති පනතේ 117 වගන්තිය අනුව, "ශ්‍රී ලංකා මහ බැංකුව කිසිදු වෙළඳාමක හෝ කිසිදු වාණිජමය කටයුත්තක, කර්මාන්තයක හෝ වෙනත් එවැනි කාර්යයක එවැනි කිසිදු ආකාරයක තෘප්තිමත් භාවයක නොවන ලැදියාවක හැර නොයෙදිය යුතුය."

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2013 වර්ෂයේදී වර්ෂ 1 ක කාලයක් සඳහා විදේශ සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර පසුව පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා තවත් වර්ෂ 1 ක කාලයකට 2014 මාර්තු 16 දින ගිවිසුම අලුත් කර තිබුණි.

* ශ්‍රී ලංකාවේ වර්තමාන සපුරා ගැනීම් හා අනාගත සැලසුම් පිළිබඳ නිරවුල් හා නිරවද්‍ය තොරතුරු පිළිබඳ ඇමෙරිකා එක්සත් ජනපදයේ තීරණ ගන්නන් සඳහා විස්තරාත්මක තොරතුරු වේදිකාවක් සැපයීම සඳහා,

* ශ්‍රී ලංකාවේ දිගු කාලීන දේශපාලන හා ආර්ථික අභිලාෂයන් වැඩි දියුණු කිරීම සඳහා බොහෝ සෙයින් මඟ පෙන්වන ඇමෙරිකා එක්සත් ජනජදයේ (USA) දේශපාලනික පරිසරය අනුගමනය කිරීමට,

* ඇමෙරිකා එක්සත් ජනපදයෙන් විශාල ප්‍රමාණයේ පුද්ගලික අංශ ආයෝජනයක් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට,

ඉහත විදේශ සමාගමට සේවා ගාස්තු ලෙස 2013 හා 2014 වර්ෂ වලදී පිළිවෙලින් රු.මිලියන 88.4 ක් හා රු.මිලියන 50.2 ක් ගෙවා තිබුණි. ඊට අමතර වශයෙන් 2013 වර්ෂයේදී ඉහත සමාගමට රු.මිලියන 12.2 ක (එජඩො 93,200) අත්තිකාරමක් චිත්‍රපටි දෙකක් නිෂ්පාදනය

කිරීමට සහ විද්‍යුත් මාධ්‍ය මගින් ඒවා විකාශනය කිරීම වෙනුවෙන් ගෙවා තිබුණි. තවද ඉහත මාධ්‍ය ව්‍යාපෘතියට ඉතිරි ගෙවීමක් ලෙස රු.මිලියන 38.0 ක මුදලක් (එජඩො 290,488 ) 2014 වර්ෂයේදී ගෙවා තිබුණි.

2014 ජුනි මාසයේදී ඉහත ගිවිසුම අවසන් කර තිබූ අතර, මහජන සම්බන්ධතා උපදේශක සේවා හා පෙළඹවීම් සේවා සිදු කිරීම සඳහා රු. මිලියන 99 ක වාර්ෂික සේවා ගාස්තුවකට වෙනත් විදේශ සමාගමක් සමඟ 2014 අගෝස්තු මාසයේදී නව ගිවිසුමකට එළඹ තිබුණි. ඉන් රු.මිලියන 49.0 ක මුදලක් ඉහත සමාගමට 2014 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබුණි. කෙසේ වුවද, ඉහත සඳහන්කළ සමාගම තෝරා ගැනීමේදී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කල බව දක්නට නොලැබුණි. තවද ශ්‍රී ලංකා රජයේ විදේශ ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ ජාතික අවශ්‍යතාවන් ප්‍රවර්ධනය, ප්‍රක්ෂේපණය හා ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳව විදේශ කටයුතු අමාත්‍යාංශයේ වගකීමක් බව විගණනයේදී නිරීක්ෂණය විය. එබැවින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එවැනි කටයුතුවල යෙදීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණුවලට පටහැනි වේ.

(ඇ) එවකට ජනාධිපති ලේකම්ගේ ඉල්ලීමට අනුව, උපදේශක සේවා ලබා ගැනීම සඳහා විදේශ සේවා සපයන්නන් තිදෙනෙකුට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,396,222,710 ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද සේවා සපයන්නන් තෝරා ගැනීම, කරන ලද කාර්යයන් හා එම සේවාවල අවශ්‍යතාවය පිළිබඳ ආධාරක ලියකියවිලි කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි. පසුව එවකට ජනාධිපති ලේකම්වරයා විසින් ඔහුගේ 2014 පෙබරවාරි 05 දිනැති ලිපිය මගින් එම මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ වියදමක් සේ සලකන ලෙස මහ බැංකු අධිපතිවරයාට දන්වා තිබුණි. ඒ අනුව මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කිරීමෙන් තොරව එම මුදල සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස සලකා තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු.2,050,619,000 ක මුළු වෘත්තීය උපදේශක සේවා වියදම්වලින් සියයට 68 ක් එම මුදලින් නියෝජනය විය.

(ඉ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව, එජඩො 250,000 ක් වන පළමු වාරිකය 2014 ඔක්තෝබර් මාසයේදී ගෙවා තිබුණි. ඉන්පසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙය ඵලරහිත වියදමක් ලෙස සලකා මෙම සමාගමෙන් ලබා ගන්නා සේවාවන් අවලංගු කිරීමට තීරණය කර තිබුණි.

" නව රජය යටතේ මූල්‍ය අංශය සඳහා ප්‍රතිපත්ති මෙහෙයවීම පෙර මෙහෙයවීමෙන් වෙනස් වීම අපේක්ෂා කෙරෙන හෙයින් , ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත සමාගමෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය පිහිටුවීම තවදුරටත් අදාළ නොවන බව මුදල් මණ්ඩලය විසින් 2015 ජනවාරි 23 දින දන්වා ඇති බවත් මුදල් මණ්ඩලය විසින් සපයන ලද තොරතුරු සැලකිල්ලට ගැනීම මගින් 2015 ජනවාරි 26 දින එහි රැස්වීමේදී ඉහත සමාගමෙන් එම සේවා ලබා ගැනීම අවලංගු කළ බවත් මෙම තීරණය 2015 ජනවාරි 23 දින ලිඛිතව දන්වා ඇති බවත්" මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් මා වෙත දන්වා තිබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) මුදල් කළමනාකරණය
(ආ) ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පාලනය